දුරකථන/தொலைபேசி இல./Telephone Nos.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister — 2784832, 2784807, 2785617

ලේකම් / செயலாளர் / Secretary — 2784812

කාර්යාලය / அலுவலகம் / Office — 2785141-50, Fax: 2784846

ඊමේල්/ஈ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk

ඔබේ අංකය / உமது இல. / Your No. ..........................................

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

"ඉසුරුපාය"
බත්තරමුල්ල.
"இசுருபாயா"
பத்தரமுல்ல.
"Isurupaya"
Battaramulla.

මගේ අංකය / எமது இல. / My No. ඊඩී/02/29/04/07/01

දිනය / திகதி / Date 2005.05.19

චක්‍රලේඛ අංක : 2005/04

පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරුන් වෙත.

## ශ්‍රී ලංකා ගුරු සේවයේ අන්තර්ග්‍රහණ ක්‍රියාවලිය සහ උසස්වීම් පරිපාටිය සංශෝධනය කිරීම.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1995.04.03 දිනැති 865/3 අංකිත අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත. 1997.03.11 දිනැති 966/5 අංකිත හා 1997.05.14 දිනැති 975/6 අංකිත ගැසට් පත්‍රය මගින් සංශෝධිත ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහය 1999 අගෝස්තු 11 දින පැවැත්වූ අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී නැවතත් සංශෝධනය කළ අතර. එම තිරණ අධ්‍යාපන ලේකම්ගේ 1/99 චක්‍රලේඛය මගින් තිකුත් කොට ඇත. ඉහත සංශෝධන සහිතව 1994.10.06 දින සිට ක්‍රියාත්මක වූ ශ්‍රී ලංකා ගුරු සේවයට ගුරු භවතුන් අන්තර්ග්‍රහණය කිරීමේදී සිදුව ඇති විෂමතා කිහිපයක් ඉවත් කිරීම සඳහාත්. ගුරු භවතුන්ගේ සේවා උසස්වීම් ලබාගැනීමේ ක්‍රියාවලිය වඩාත් නිවැරදි කිරීම සඳහාත් ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාව පහත සඳහන් පරිදි නැවත සංශෝධනය කිරීමටද ගුරුවරුන්ගේ උසස්වීම් වලට අදාලව පහත සඳහන් පූර්ව අවශ්‍යතාවයන් ගෙන් නිදහස් කිරීමටද 2005.01.12 දින රැස්වූ අමාත්‍ය මණ්ඩලය තිරණය කර තිබේ. එම තීරණ පදනම් කොට ගෙන ශ්‍රී ලංකා ගුරු සේවයේ ගුරුවරුන් ඔවුන් සුදුසුකම් ලබා ඇති පන්තියට / ශ්‍රේණියට උසස් කිරීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලැබී ඇත.

02. ඒ අනුව ශ්‍රී ලංකා ගුරු සේවයට, ගුරු භවතුන් අන්තර්ග්‍රහණය කිරීමේදී මෙමෙතක් පැවැති චක්‍රලේඛ උපදෙස් අභිබවා පහත තීරණ ක්‍රියාත්මක කළ යුතුය.

(i) 2004.12.31 දිනට පෙර පත්වීම් ලැබ රජයේ පාසල්වල උපාධිධාරී අභ්‍යාසලාභී පදනමින් සේවය කළ ගුරු භවතුන් එම පත්වීම අනුව වැඩභාරගත් දින සිට ස්ථිර උපාධිධාරී ගුරුවරුන් ලෙස සලකා ශ්‍රී ලංකා ගුරු සේවයට අන්තර්ග්‍රහණය කිරීමටත්. එම සේවා කාලය ඒ අයුරින්ම ඔවුන්ගේ උසස්වීම් සඳහා පිළිගැනීමටත්. එසේ අන්තර්ග්‍රහණය කිරීම හා උසස්වීම් ලැබීම මත හිමිවන වැටුප් 2004.12.31 දින දක්වා හිඟ වැටුප් ගෙවීමකින් තොරව 2005.01.01 දින සිට ගෙවීම.

(ii) 2004.12.31 දිනට පෙර පත්වීම් ලැබ රජයේ පාසල්වල සේවයේ යෙදී සිටි සාමාන්‍ය අභ්‍යාසලාභී ගුරුවරු. මෞලවි අභ්‍යාසලාභී ගුරුවරු සහ ඒ ගණයේ ලා සැලකෙන ඊට සමාන වෙනත් ගුරුභවතුන් ඔවුන් බඳවාගත් පරිපාටිය අනුව සුදුසුකම් සපුරනු ලැබූ දිනය හෝ පත්වීම අනුව වැඩ භාරගත් දිනය යන දින දෙකෙන් පසුව එළඹෙන දින සිට පුහුණු ගුරු භවතුන් ලෙස සලකා ශ්‍රී ලංකා ගුරු සේවයට අන්තර්ග්‍රහණය කිරීමටත් එම කාලය ගුරු සේවයේ උසස්වීම් සඳහා පුහුණු ගුරු සේවා කාලයක් සේ සැලකීමටත්. ඒ අනුව හිමිවන වැටුප් 2004.12.31 දින දක්වා හිග වැටුප් ගෙවීමකින් තොරව 2005.01.01 දින සිට ගෙවීම.

(iii) 1994.10.06 දිනට පෙර ගුරුවරයෙකු ලෙස ස්ථිර පත්වීමක් ලැබූ අයෙකු එම පත්වීම ලැබීමට පෙර පිළිගත් උපාධියක් ලබා සිටියේ නම්. එම පත්වීම අනුව වැඩ භාරගත් දින සිටම ස්ථිර උපාධිධාරී ගුරු භවතෙකු ලෙස සලකා ශ්‍රී ලංකා ගුරු සේවයට අන්තර්ග්‍රහණය කිරීමටත්. ගුරු සේවයේ උසස්වීම් සඳහා එකී සේවා කාලය උපාධි ගුරු සේවා කාලයක් සේ සලකා කටයුතු කිරීමටත්. ඒ අනුව හිමිවන වැටුප් 2004.12.31 දින දක්වා හිගවැටුප් ගෙවීමකින් තොරව 2005.01.01 දින සිට ගෙවීම.

(iv) 1994.10.06 දින වන විට වයස අවුරුදු 45 ක්වූ හෝ ඊට වැඩි වෘත්තිය සුදුසුකම් රහිත උපාධිධාරී ගුරුවරුභවතුන් වෘත්තිය සුදුසුකම් සහිත උපාධිධාරී ගුරුවරුන් ලෙස සලකා ශ්‍රී ලංකා ගුරු සේවයට අන්තර්ග්‍රහණය කිරීම සහ ඒ අනුව හිමිවන වැටුප් 2004.12.31 දක්වා හිග වැටුප් ගෙවීමකින් තොරව 2005.01.01 දින සිට ගෙවීම.

(v) 1994.10.06 දින වන විට. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 37/92 අනුව ගෞරව උපාධිධාරීන් ලෙස සලකා වැටුප් ලැබූ සියළුම උපාධිධාරී ගුරුභවතුන්. ගෞරව උපාධිධාරී ගුරු භවතුන් සේ සලකා ශ්‍රී ලංකා ගුරු සේවයට අන්තර්ග්‍රහණය කිරීම සහ ඒ අනුව හිමිවන වැටුප් 2004.12.31 දින දක්වා හිග වැටුප් ගෙවීමකින් තොරව 2005.01.01 දින සිට ගෙවීම.

(vi) රජය පිළිගත් ආයතනයක කෘෂිකර්මය පිළිබඳ ඩිප්ලෝමාව/ ගෘහ ආර්ථික විද්‍යා ඩිප්ලෝමාව/ කණිෂ්ඨ විශ්ව විද්‍යාල ඩිප්ලෝමාව යන දෑ අවුරුදු ඩිප්ලෝමාවක් හෝ තුන් අවුරුදු සෞන්දර්ය ඩිප්ලෝමාව යන ඩිප්ලෝමාවලින් එක් ඩිප්ලෝමාවක් හෝ කිහිපයක් ලබා 1994.10.06 දිනට පෙර රජයේ පාසලක ගුරු පත්වීමක් ලැබූ ගුරු භවතෙකු එම පත්වීම අනුව වැඩ භාරගත් දින හෝ ඉහත සහතිකය ලැබූ දින යන දින දෙකෙන් පසුව එළඹෙන දින සිට පුහුණු ගුරුවරයෙකු ලෙස සලකා ශ්‍රී ලංකා ගුරු සේවයට අන්තර්ග්‍රහණය කිරීමටත්. එම කාලය උසස්වීම් සඳහා පුහුණු ගුරු සේවා කාලයක් සේ සලකා කටයුතු කිරීමටත් ඒ අනුව හිමිවන වැටුප් 2004.12.31 දින දක්වා හිග වැටුප් ගෙවීමකින් තොරව 2005.01.01 දින සිට ගෙවීමටත් ක්‍රියා කිරීම.

03. ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහය - සංශෝධනය කිරීම්

මෙහි පළමුවන වගන්තියේ සඳහන් 2005.01.12 දින අමාත්‍යමණ්ඩල තීරණය පරිදි ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ II වන කොටසේ 3:2 වගන්තියට පහත උප වගන්තිය එකතු කෙරේ.

(ඉ) ඉහත (අ) සහ (ආ) වගන්ති වල සඳහන් පරිදි සෑම වසර දෙකකටම ලකුණු 01 බැගින් ලබා දීමේදී ඉතිරි වන ශේෂය. වසරක් හෝ ඊට වැඩි නම් එකී සේවා කාලය වෙනුවෙන් තවත් එක් ලකුණක් ලබා දිය යුතුය.

(ඇ) ඉහත (ආ) වගන්තියේ සඳහන් පරිදි සෑම වසරක් සඳහාම ලකුණු 01 බැගින් ලබා දීමේදී ඉතිරි වන ශේෂය මාස 06ක් හෝ ඊට වැඩි නම් එකී සේවා කාලය වෙනුවෙන් තවත් එක් ලකුණක් ලබා දිය යුතුය.

04. නිදහස්කිරීම්

ඉහත සඳහන් 2005.01.12 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, ශ්‍රී ලංකා ගුරු සේවයේ යම් පන්තියක / ශ්‍රේණියක සිටින, ඊට ඉහළ පන්තියට / ශ්‍රේණියට උසස්වීම් ලබා ගැනීම සඳහා ප්‍රමාණවත් ලකුණු උපයාගත් ව්‍යවස්ථාවේ සඳහන් පරිදි ඉටු කළ යුතු හෝ සමත්විය යුතු පහත සඳහන් අවශ්‍යතාවයන්ගෙන් 2004.12.31 දින දක්වා නිදහස් කෙරේ.

i) සේවාස්ථ පුහුණු වැඩසටහන් සඳහා සහභාගීත්වය.
ii) වෘත්තීය සමාලෝචනය සමත් වීම
iii) කඩඉම් විභාගය සමත්වීම
iv) නම් කළ නිශ්චිත පාසලක නිශ්චිත සේවා කාලයක් තිබීම

05. ගුරු සේවා උසස්වීම් ලබා දීම

ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන හා ඉහත කාරණය පිළිබඳව 2005.01.12 දිනැති අමාත්‍යමණ්ඩල තීරණය අනුව 2004.12.31 දින දක්වා පමණක් මතු දැක්වෙන පරිදි කටයුතු කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව අනුමත කොට ඇත.

(i) ශ්‍රී ලංකා ගුරු සේවයේ 3වන පන්තියේ II වන ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරන ලද ගුරු පුහුණු සහතිකයක් / බාහිර උපාධියක් හෝ ඒ හා සමාන සුදුසුකමක් මෙතෙක් උපයා නොගත් නුපුහුණු ගුරුවරයෙකු වේ නම් එම ගුරුභවතාගේ නුපුහුණු ගුරු සේවා කාලය වර්ෂ 10 සපිරෙන දිනය හෝ 1994.10.06 යන දින දෙකෙන් පසුව එළඹෙන දිනයට අනෙකුත් සුදුසුකම් නොසලකා ශ්‍රී ලංකා ගුරු සේවයේ 3වන පන්තියේ I වැනි ශ්‍රේණියට උසස් කිරීම.

(ii) ශ්‍රී ලංකා ගුරු සේවයේ 3වන පන්තියේ I ශ්‍රේණියේ පුහුණු, පුහුණු ඩිප්ලෝමාධාරීන් හා වෘත්තීය සුදුසුකම් රහිත උපාධිධාරීන් යන වර්ග තුනට අයත් ගුරු භවතුන් සහ ඒ හා සමාන සුදුසුකම් ලත් ගුරු භවතුන් 3වන පන්තියේ සේවා කාලය තුළ උපයාගත් ලකුණු 05ක් ලැබූ දිනය හෝ 1994.10.06 යන දින දෙකෙන් පසුව එළඹෙන දින සිට අනෙකුත් සුදුසුකම් නොසලකා 2වන පන්තියේ II ශ්‍රේණියට උසස් කිරීම.

(iii) ශ්‍රී ලංකා ගුරු සේවයේ 2වන පන්තියේ II වන ශ්‍රේණියේ පුහුණු, පුහුණු ඩිප්ලෝමාධාරීන් හා වෘත්තීය සුදුසුකම් සහිත උපාධිධාරීන් යන ගුරු භවතුන් සහ ඒ හා සමාන සුදුසුකම් ලත් ගුරුභවතුන් අතුරින් 2වන පන්තියේ II වන ශ්‍රේණියේදී ලකුණු 10ක් උපයාගත් ගුරුභවතුන්, අනෙකුත් සුදුසුකම් නොසලකා, ඉහත ලකුණු 10 උපයාගත් දිනය හෝ 1994.10.06 යන දින දෙකෙන් පසුව එළඹෙන දින සිට 2වන පන්තියේ I වන ශ්‍රේණියට උසස්කිරීම.

(iv) ශ්‍රී ලංකා ගුරු සේවයේ 2වන පන්තියේ I ශ්‍රේණියේ සිටින පුහුණු, පුහුණු ඩිප්ලෝමාධාරීන්, වෘත්තීය සුදුසුකම් සහිත උපාධිධාරීන් සහ ඒ හා සමාන සුදුසුකම් ලත් ගුරු භවතුන් අතුරින් 2වන පන්තියේ I ශ්‍රේණියේ සේවාකාලය තුළදී ලකුණු 05ක් උපයාගත් ගුරුභවතුන්, අනෙකුත් සුදුසුකම් නොසලකා, ඉහත ලකුණු 05 උපයාගත් දිනය හෝ 1994.10.06 දිනය යන දින දෙකෙන් පසුව එළඹෙන දින සිට 1වන පන්තියට උසස්කිරීම.

(v) ඉහත සඳහන් 2005.01.12 දිනැති අමාත්‍යමණ්ඩල තීරණය මගින්, ගුරුභවතුන්ගේ උසස්වීම් සඳහා බලපානු ලබන ලකුණු හැර අනෙකුත් සියලුම අවශ්‍යතා 2004.12.31 දක්වා නිදහස් කොට ඇත. ඒ අනුව ඉහත අවස්ථා වලදී ගුරුභවතුන්ට උසස්වීම් ලබා දිය යුතු දිනය 2005.01.01 හෝ ඊට පෙර දිනයක් විය යුතු අතර 1994.10.06 හෝ ඊට පසු දිනයක් වීම අවශ්‍ය වේ. ශ්‍රී ලංකා ගුරු සේවයට අන්තර්ග්‍රහණය කරනු ලැබූ2005.01.01 හෝ ඊට පෙර දිනයක විශ්‍රාම ලබා ඇති ගුරුභවතුන්ටද මෙය යථා යෝග්‍ය වන පරිදි අදාල කර ගත යුතුය.

06. මෙම චක්‍රලේඛනයේ විධිවිධාන අනුව අන්තර්ග්‍රහණය කිරීමෙන් හෝ උසස්වීම් ලැබීමෙන් ගුරුභවතුන්ගේ වැටුප් වැඩි වන විටෙක, 2004.12.31 දින දක්වා හිඟ වැටුප් ගෙවීමකින් තොරව 2005.01.01 දින සිට වැටුප් හිමිකම ලබා දිය යුතුය. ඉහත උසස්වීම් සිදුකිරීමෙන් අනතුරුව වැටුප් සකස් කළ යුත්තේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 11/94 සහ 7/2000 මගින් සංශෝධිත ආයතන සංග්‍රහයේ VII වන පරිච්ඡේදයේ 5වන වගන්තිය අනුවය.

07. මෙම චක්‍රලේඛන ක්‍රියාත්මක කිරීමේදී අවශ්‍ය වන අමතර ප්‍රතිපාදන ප්‍රමාණය ගණනය කොට ලබා ගැනීමට කටයුතු කරන්න.

08. මෙම චක්‍රලේඛනය නිකුත්කරනු ලබන්නේ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ එකගත්වය මතය.

09. මෙහි දැක්වෙන සංශෝධන හා ඊට අදාල උපදෙස් පරිදි උසස්වීම් ලැබීමට හිමිකම් ලබා සිටින සියළුම ගුරුභවතුන්ට උසස්වීම් ලබා දීමට නොපමාව කටයුතු කරන්න.

මෙම චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන පරිදි කටයුතු කිරීමේදී යම් ගැටළුවක් වෙතොත් මා විමසන ලෙසද වැඩි දුරටත් දන්වමි.

.......................................
වෛද්‍ය ටාරා ද මෙල්
ලේකම්
අධ්‍යාපන අමාත්‍යංශය

පිටපත් :

(i) ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව - දැ.ගැ.ස. සහ අ.ක.ස.

(ii) පළාත් අධ්‍යාපන ලේකම්වරුන් - පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදේශ්මන - අ.ක.ස.

(iii) පළාත් අධ්‍යක්ෂවරුන් - දැ.ගැ.ස. සහ අ.ක.ස.
(රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විෂය පථයට ගැනෙන ජාතික පාසැල්වලසේවය කරන ශ්‍රේණිධාරීන්ගේ උසස්වීම් රා.සේ.කො. ට අනුමත කළ යුතු බැවින් අදාල නිර්දේශරාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යැවීමට, මා වෙත එවීමට)

(iv) කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකවරුන් - දැ.ගැ.ස සහ අ.ක.ස.

(v) කොට්ඨාශ භාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් - දැ.ග.ස. සහ අ.ක.ස.